(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

**අංක 1(8).]**

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2022 මාර්තු 25 සිකුරාදා**

**2022 අප්‍රේල් 05 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

සත්ව සුබසාධන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 1),— සංශෝධිත (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 8 සහ 30 වගන්ති සමඟ කියවිය යුතු 32 වගන්තිය යටතේ ආරක්ෂිත සලකුණු සහ ආරක්ෂිත සලකුණු කළමනාකරණ පද්ධතිය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ඔක්තෝබර් 16 දිනැති අංක 2249/50 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.03.24 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 10/2021 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 2),— කලින් කලට සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 ජනවාරි 01 දිනැති අංක 2260/78 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.03.24 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 01/2022 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 3),— කලින් කලට සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ වාර්ෂික මත්පැන් බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 ජනවාරි 01 දිනැති අංක 2260/79 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.03.24 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 02/2022 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියමය (අංක 1),— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/58 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.03.24 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියමය (අංක 2),— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 ජනවාරි 11 දිනැති අංක 2262/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.03.24 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 1),— (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 122, 122අ වගන්ති සහ VIIඅ කොටස සමඟ කියවිය යුතු, 237 වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 ඔක්තෝබර් 29 දිනැති අංක 2251/63 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.03.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 2),— (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5, 19 සහ 20 වගන්ති සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 අගෝස්තු 14 දිනැති අංක 2240/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.03.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**2022 අප්‍රේල් 06 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

41/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ස්වභාවිකව වැවෙන මිනිස් ආහාරයට සුදුසු බිම්මල් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම බිම්මල් වර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ නම් කවරේද;

(iv) ඒ අතරින් ඒකදේශික බිම්මල් වර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ස්වයං රැකියාවක් ලෙස බිම්මල් වගා කරනු ලබන වගාකරුවන්ට අවශ්‍ය බීජ ආනයනය කරන්නේද;

(ii) එසේ නම්, එම රටවල් කවරේද;

(iii) ඒ සඳහා වර්ෂයකට වැය කරනු ලබන මුදල කොපමණද;

(iv) දේශීය බිම්මල් බීජ, වගාකරුවන් අතර ප්‍රචලිත කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(v) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) බිම්මල් වගාකරුවන්ට රජය සහන ලබාදීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම සහන කවරේද;

යන්න එතුමා තවදුරටත් සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1029/2022

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ අලි-මිනිස් ගැටුම හේතුවෙන් ජීවිත හානි සහ දේපළ හානි සිදු වන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) වන අලි පහරදීම හේතුවෙන් 2019 වර්ෂයේදී සිදු වූ පුද්ගල මරණ සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වන අලි පහරදීම හේතුවෙන් සිදු වන පුද්ගල මරණයක් වෙනුවෙන් මේ වනවිට ගෙවනු ලබන වන්දි මුදල කොපමණද;

(iii) 2019 වර්ෂයේදී වන අලි පහරදීම හේතුවෙන් සිදු වූ දේපළ හානි වෙනුවෙන් ගෙවන ලද මුළු වන්දි මුදල කොපමණද;

(iv) වන අලි පහරදීම්වලින් ජනතාව මුදා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

**2022 අප්‍රේල් 07 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

42/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ බට, වේවැල්, පන් හා හණ ආශ්‍රිත නිෂ්පාදන සිදු කරනු ලබන ගම්මාන සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් කර්මාන්තය සිදු කරනු ලබන ගම්මාන සංඛ්‍යාව හා එම එක් එක් කර්මාන්තයේ යෙදෙන පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම කර්මාන්තකරුවන් මුහුණ දෙන ප්‍රධාන ගැටලු කවරේද;

(ii) ඉහත කර්මාන්තකරුවන් සඳහා නව තාක්ෂණය ලබාදීමට කටයුතු කර තිබේද;

(iii) එසේ නම්, ඒ කෙසේද;

(iv) එම කර්මාන්තකරුවන්ගේ වෙළෙඳපොළ පුළුල් කිරීමට පියවර ගෙන තිබේද;

(v) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මේ වනවිට විසිතුරු බට, වේවැල්, පන් හා හණ භාණ්ඩ අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, එම රටවල් කවරේද;

(iii) 2015 හා 2016 යන එක් එක් වර්ෂයේදී බට, වේවැල්, පන් හා හණ භාණ්ඩ අපනයනයෙන් ලැබුණු ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

256/2022

ගරු හේෂා විතානගේ මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් පෞද්ගලික බවුසර් රථ හිමියන්ගේ සංගමයේ සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් සාමාජිකයාගේ නම, ලිපිනය හා ඔහුට අයත් බවුසර් රථයේ අංකය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉන්ධන මිල ඉහළ යැමට සාපේක්ෂව ප්‍රවාහන ගාස්තු සංශෝධනය නොකිරීම හේතුවෙන් ඉහත සංගමයේ සාමාජිකයන් දුෂ්කරතාවලට මුහුණ දී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම ගැටලුව විසඳීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

576/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා කෘෂි දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීම අතිශය වැදගත් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් කෘෂි දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීම ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) මේ දක්වා ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iv) කෘෂි දත්ත ගබඩාව ස්ථාපිත කිරීමේදී යම් වංචාවක් සිදුවී තිබේ නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1030/2022

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය වැඩි දියුණු කළ යුතු බවත්;

(ii) ඒ වෙනුවෙන් දේශීය හා විදේශීය සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා ජාතික උරුමයන් උපයෝගී කරගත යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පැරණි රාජධානි 04 පිහිටි ස්ථානවලට සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා මේ වනවිට වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(ii) දඹදෙණිය රජමහා විහාරය සහ රාජධානිය සංචාරක සිතියමට ඇතුළත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

1180/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මුළු පවුල් සංඛ්‍යාව අතරින් ස්ථිර නිවාස නොමැති පවුල් සංඛ්‍යාව;

(ii) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ස්ථාපිත කරන ලද දිනයේ සිට එම අධිකාරිය විසින් මේ දක්වා ඉදිකර ඇති, ආධාර ලබා දී ඇති සහ ණය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(iii) වර්ෂ 2015 සිට 2019 දක්වා එම අධිකාරිය විසින් ඉදිකර ඇති සහ ආධාර ලබා දී ඇති නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(iv) එම කාලය තුළ ඉදිකරන ලද නිවාස ව්‍යාපෘති විවෘත කිරීමේදී, එහි ප්‍රචාරක වියදම් සඳහා වැය කරන ලද මුදල;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2022 අප්‍රේල් 08 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

10/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ ඉඩම් අහිමි වූ පුද්ගලයන්ට ව්‍යවස්ථාපිත නිශ්චය යටතේ ඉඩම් ලබා දිය යුතු බවත්;

(ii) එසේ වුවද, ඉඩම් ලබාදිය යුතු සියලු දෙනාටම ඒ යටතේ ඉඩම් ලබාදී නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) 2021.12.31 දින දක්වා ව්‍යවස්ථාපිත නිශ්චය යටතේ ඉඩම් ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව;

(ii) ඔවුන්ට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර්වලින්;

(iii) ඒ යටතේ 2021.12.31 දින දක්වා ඉඩම් ලබා දිය යුතු පුද්ගලයන් සංඛ්‍යාව;

(iv) ඔවුන්ට ලබා දිය යුතු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර්වලින්;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ව්‍යවස්ථාපිත නිශ්චය යටතේ ඉඩම් ලබා දී නොමැති පුද්ගලයන්ට ලබා දීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතුව ඉඩම් තිබේද;

(ii) නොඑසේ නම්, එම පුද්ගලයන්ට ඉඩම් ලබා දෙනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) ඉහත (i)හි සඳහන් පුද්ගලයන්ට ඉඩම් ලබා දීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට නිසි සැලසුමක් තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන්ට ඉඩම් ලබා දී අවසන් කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

43/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, වෙන්කල්අඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 186 පන්කුඩවේලි ග්‍රාම නිලධාරි වසමේ, ඉලුප්පච්චේන ග්‍රාමයේ, මුරුගන් කෝවිල අසල පිහිටි පැරණි නටබුන් සහිත ස්ථාන විනාශකර ඇති බව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරදියනාරු පොලිසියට පැමිණිලි කර ඇති බව දන්නේද;

(ii) එම සිද්ධියට අදාළ පුද්ගලයන් අත්අඩංගුවට ගෙන තිබේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන්ට එරෙහිව ගෙන ඇති නීතිමය පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

255/2022

ගරු හේෂා විතානගේ මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුවේට්හි තානාපති කාර්යාලය කොවිඩ්-19 වසංගතය හේතුවෙන් වසා දැමීමෙන් එරටෙහි සේවය කරනු ලබන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් අපහසුතාවයට පත්වන බව දන්නේද;

(ii) එම තානාපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක සුරක්ෂා මධ්‍යස්ථානයෙන් වාර්තා වී ඇති කොවිඩ් -19 රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට කුවේට්හි සේවය කරනු ලබන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් කොවිඩ්-19 වසංගතයෙන් ආරක්ෂා කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

575/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ආර්ථික මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ අරමුණු;

(ii) මේ වනවිට, ආරම්භක අරමුණුවලින් බැහැරව එම ආර්ථික මධ්‍යස්ථාන ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් ගනු ලබන පියවර;

(iii) ශ්‍රී ලංකාවේ සියලු ආර්ථික මධ්‍යස්ථාන, එක් ආයතනයක් මඟින් නියාමනය කිරීම සඳහා ගනු ලබන පියවර;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1028/2022

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට සමෘද්ධි ප්‍රතිලාභය ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට සේවය කරනු ලබන සමෘද්ධි සංවර්ධන නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සමෘද්ධි සංවර්ධන නිලධාරින් විසින් විශාල සේවාවක් ඉටුකරනු ලබන බව දන්නේද;

(iv) සමෘද්ධි සංවර්ධන නිලධාරින්ට පවතින වෘත්තීය ගැටලු හඳුනාගෙන තිබේද;

(v) එම වෘත්තීය ගැටලු විසඳීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(vi) නොඑසේ නම්, එම ගැටලු විසඳනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්,ඒ මන්ද?

1181/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමෘද්ධි ව්‍යාපාරය ආරම්භ කරන ලද 1995 වර්ෂය වනවිට ශ්‍රී ලංකාවේ දිළිඳුභාවය ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) සමෘද්ධි ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රමවේදය කවරේද;

(iii) සමෘද්ධි සහනාධාරය ලැබීම සඳහා සුදුසුකම් ලබන අවම ආදායම් මට්ටම කොපමණද;

(iv) මේ වනවිට සිටින සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව ඔවුන්ට ගෙවනු ලබන එක් එක් සමෘද්ධි සහනාධාරයේ වටිනාකම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) සමෘද්ධි සහනාධාරය ලබා දීම සඳහා වාර්ෂිකව වැය කරනු ලබන මුදල කොපමණද;

(vi) මිය යාම, ආදායම් වැඩි වීම හා වෙනත් හේතු මත වාර්ෂිකව සමෘද්ධි ව්‍යාපාරයෙන් ඉවත් කරනු ලබන සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සමෘද්ධි සහනාධාර ලැබිය යුතු නමුත් මේ වනවිට සමෘද්ධි සහනාධාරය ලැබී නොමැති අඩු ආදායම්ලාභීන් විශාල සංඛ්‍යාවක් සිටින බව පිළිගන්නේද;

(ii) ඔවුන්ට සමෘද්ධි සහනාධාරය ලබා දීම සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1196/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හොරණ, වගවත්ත ටයර් කර්මාන්තශාලාව ඉදිකිරීමේ ව්‍යාපෘතියට යටිතල පහසුකම් ලබා දීම සඳහා භාවිතා කරන ලද අරමුදල් කවරේද;

(ii) එම කර්මාන්තශාලාව සඳහා ලබා දී ඇති විදුලි සම්බන්ධතාවය මෙගාවොට්වලින් කොපමණද;

(iii) ඉහත ව්‍යාපෘතිය සඳහා ජල සැපයුම ලබා දෙන ලද ආකාරය කවරේද;

(iv) එම ව්‍යාපෘතියේ පිවිසුම් මාර්ගය ඉදිකිරීම සඳහා රජය විසින් වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1318/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005, 2010, 2015 හා 2019 යන එක් එක් වර්ෂයේදී සිදු වී ඇති රථ වාහන අනතුරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(ii) එම අනතුරු හේතුවෙන් මරණයට පත් වූ පුද්ගලයන් සංඛ්‍යාව;

(iii) එම අනතුරු හේතුවෙන් හානි වී ඇති දේපළවල වටිනාකම;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1476/2022

ගරු රෝහණ බංඩාර මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවතින වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව්වල නම් කවරේද;

(iii) එම වැව් අතරින් වර්තමාන රජයේ වැව් සංවර්ධනය කිරීමේ වැඩසටහන සඳහා ඇතුළත් කර ඇති වැව් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වැව්වල නම් කවරේද;

(v) ඉහත වැඩසටහන සඳහා ඇතුළත් කර නොමැති වැව් ද කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1735/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 2021/2022 වර්ෂයේ මහ කන්නයේදී වගා කරන ලද කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම කන්නයේ අපේක්ෂිත වී අස්වැන්න කොපමණද;

(iii) එම වී අස්වැන්න මිලදී ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 අප්‍රේල් 19 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

6/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මධ්‍යම අධිවේගී මාර්ගයේ කුරුණෑගල සිට දඹුල්ල දක්වා වූ සිව්වන අදියරේ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා ටෙන්ඩර් කැඳවා තිබේද;

(ii) එසේ නම්, එම කොන්ත්‍රාත්තුව පිරිනැමීමට කටයුතු කර තිබේද;

(iii) ඉහත මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද සමාගම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගය ඉදිකිරීමේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(ii) එම මාර්ගය ඉදිකිරීම සඳහා මුදල් සපයා ගන්නා ලද මූලාශ්‍රය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

39/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි ටිකට්පත් මුද්‍රණය කරනු ලබන ආයතන කවරේද;

(ii) එම ආයතන තෝරා ගනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ආයතන විසින් එක් ලොතරැයි ටිකට්පතක් මුද්‍රණය කිරීම සඳහා අය කරනු ලබන මිල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ලොතරැයි ටිකට්පත් මුද්‍රණය කිරීමේදී 2014.12.31 දිනට පෙර ඉහත ආයතනය/ ආයතනවල මිල ගණන් තුළින් විශාල මූල්‍ය අක්‍රමිකතාවක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iv) එම පරීක්ෂණයේ ප්‍රතිඵල කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

254/2022

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ප්‍රවීණ රංගන ශිල්පී සෞම්‍ය ලියනගේ මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ, පශ්චාත් උපාධි පීඨයේ, පීඨාධිපති ලෙස පත්කරන ලද දිනය කවරේද;

(ii) ඔහු එම තනතුරෙන් ඉවත් කරන ලද දිනය කවරේද;

(iii) එම තනතුරෙන් ඒ මහතා ඉවත් කිරීමට හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

569/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ග්‍රාමීය ප්‍රාග්ධන බැංකුව ස්ථාපනය කිරීමේ අරමුණු කවරේද;

(ii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම බැංකුව නියාමනය කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1022/2022

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) දේශීය කර්මාන්තයක් ලෙස බතික් කර්මාන්තය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මේ වනවිට බතික් කර්මාන්තයේ යෙදෙන ව්‍යවසායකයන් හඳුනාගෙන තිබේද;

(ii) එම ව්‍යවසායකයන් දිරිගැන්වීම සඳහා අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) බතික් නිෂ්පාදනයේදී එම ව්‍යවසායකයන් පැරණි ක්‍රමවේද සහ විලාසිතා භාවිතා කරන බවත් එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නව තාක්ෂණය භාවිතා කරමින් නවීන විලාසිතා අනුව බතික් නිෂ්පාදනය කිරීම සඳහා මහපෙන්වීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1175/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1189/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "නෙළුම් කුලුන" ව්‍යාපෘතිය සඳහා මුදල් සපයා ගනු ලැබූ ප්‍රභවය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා ලබා ගන්නා ලද ණය මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය මඟින් ඉපයීමට අපේක්ෂිත වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1319/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් නිෂ්පාදන කටයුතු සඳහා කර්මාන්තකරුවන්ට තඹ ලබා දෙන්නේද;

(ii) එසේ නම්, වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයේදී එසේ ලබා දෙන ලද තඹ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ සිදු කරන ලද පාස්කු ඉරු දින ප්‍රහාරයට සම්බන්ධ ඉන්ෂාෆ් අහමඩ් නැමැත්තාට අයත් සමාගමකට තඹ ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම සමාගමට ලබා දී ඇති තඹ ප්‍රමාණය කොපමණද;

(iii) එම තඹ ආශ්‍රයෙන් ඉහත සමාගම කරන ලද නිෂ්පාදනයන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1467/2022

ගරු රෝහණ බංඩාර මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) අනුරාධපුර නගර සීමාව තුළ අනවසර ඉදිකිරීම් රැසක් සිදු කරනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම ඉදිකිරීම් නැවැත්වීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1736/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පාලනය යටතේ පවතින ගොවිපොළ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) 2018 වර්ෂයේ සිට මේ දක්වා එම එක් එක් ගොවිපොළේ නිෂ්පාදන සහ එම එක් එක් වර්ගයෙන් නිෂ්පාදනය කරන ලද ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත සඳහන් ගොවිපොළ තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?